# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1687/30 - 2011 ජනවාරි 06 වැනි බ්‍රහස්පතින්දා - 2011.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9අ වගන්තියේ (අ) සහ (ආ) ඡේදවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, 1999 මාර්තු මස 17 දිනැති අංක 1071/8 සහ 2011 ජනවාරි මස 03 දිනැති අංක 1687/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රවල* පළ කරන නියමයන් මගින් සංශෝධිත 1987 මැයි මස 12 දිනැති අංක 453/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අක්කරයිපත්තු ප්‍රාදේශීය සභාව සංස්ථාපනයට අදාළ නියමය, මෙම නියමයෙන් -

(1) (*අ*) එහි උපලේඛනය ඉවත්කර මෙහි උපලේඛනය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි ;

(*ආ*) එහි (4) වැනි ඡේදයේ සඳහන් "නව" යන පදය ඉවත් කර ඒ වෙනුවට "පස්" යන පදය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

(2) යථෝක්ත සංශෝධන 2011 අප්‍රේල් මස පළමුවන දින සිට බලාත්මක විය යුතු යයි නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

1A - G 12045 — 1085 (2011/01)

**උපලේඛනය**

***I*** *වැනි කොටස*

අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහත සදහන් ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය

පට්ටියඩිපිට්ටි - (AP/20/A), පල්ලික්කුඩියිරුප්පු - 01 (AP/20/A/1), පල්ලික්කුඩියිරුප්පු - 02 (AP/20/A/2), ඉසංගනිසීමයි - (AP/20/A/3), ආලිම් නගර් - (AP/20/A/4)

***II*** ***වැනි කොටස***

අක්කරපත්තු ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා මායිම්:

*උතුරට* :

දකුණ ඉවුර ප්‍රධාන වාරි ඇළ සහ පනන්කාට්ටු ප්‍රධාන වාරි ඇළ හමුවන මධ්‍ය ලක්ෂයේ සිට දකුණු ඉවුර ප්‍රධාන වාරි ඇළ මධ්‍ය රේඛාව දිගේ නැගෙනහිර දෙසට තිස්දෙවන දකුණු ඉවුර වාරි ඇළ දක්වා ගොස්, එතැන් සිට අඩ්ඩලච්චේන ප්‍රාදේශීය සභාවේ දැනට පවතින දකුණු මායිම හරහා නැගෙනහිර දෙසට ගොස්, පට්ටියඩිප්පිට්ටි පාලමේ මධ්‍ය ලක්ෂයේ සිට උතුරු දෙසට තිල්ලෙයි ගඟ හරහා ගමන් කරන රේඛාව ද හමුවන ලක්ෂය දක්වා ද,

*නැගෙනහිරට* :

අවසන් වරට සඳහන් කරන ලක්ෂ්‍යයේ සිට දකුණු දෙසට තිල්ලෙයි ගඟ දිගේ පට්ටියඩිප්පිට්ටි පාලමේ මධ්‍ය ලක්ෂය දක්වා ද,

දකුණට :

අවසන් වරට සඳහන් කළ පට්ටියඩිප්පිට්ටි පාලමේ මධ්‍ය ලක්ෂයේ සිට දකුණු දෙසට තිලේලයි ගඟේ මධ්‍ය රේඛාව දිගේ 31 දරන දකුණු ඉවුර වාරි ඇළ සහ තිල්ලෙයි ගඟ හමුවන ලක්ෂය දක්වා ගොස් (පට්ටියඩිප්පිට්ටි ග්‍රාම සේවා වසමේ දකුණු මායිම) එතැන් සිට 31 දකුණු ඉවුර ඇළෙහි මධ්‍ය රේඛාව ඔස්සේ එම ඇළ මාර්ගය සහ 14 වැනි පනන්කාට්ටු ඇළ මාර්ගය හමුවන ලක්ෂය දක්වා ගොස්, එම ලක්ෂයේ සිට 14 වන පනන්කාට්ටු ඇළෙහි මධ්‍ය ලක්ෂය දිගේ (ආලිම් නගර් ග්‍රාම සේවා වසමේ දකුණු මායිම) බටහිර දෙසට පනන්කාට්ටු ප්‍රධාන වාරි ඇළ දක්වා ගොස් එතැන් සිට බටහිර දෙසට පනන්කාට්ටු ප්‍රධාන වාරි ඇළෙහි මධ්‍ය රේඛාව ඔස්සේ 13 වැනි පනන්කාට්ටු ඇළ දක්වා ගොස් එතැන් සිට එම 13 වැනි පනන්කාට්ටු ඇළෙහි මධ්‍ය රේඛාව දිගේ ගිනිකොන දිසාව දෙසට ආනෙයිවිලුන්දාන්වට්ටෙයි හි නැගෙනහිර බැම්ම දක්වා ගොස් එතැන් සිට එම බැම්ම දිගේ නිරිත දිසාව දෙසට නීත්තෙයි ආරු දක්වා ගොස් එම ලක්ෂයේ සිට නිරිත දිසාව දෙසට කරුප්පාවෙලි ඇළ දක්වා ගොස් එතැන් සිට කරුප්පාවෙලි ඇළේ මධ්‍ය රේඛාව ඔස්සේ දැනට ඇති *ගැසට් පත්‍රයේ* සඳහන් දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මායිම් දක්වා ද,

බස්නාහිරට :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට උතුරට, දැනට ඇති *ගැසට් පත්‍රයේ* සඳහන් වන දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දැනට ඇති *ගැසට් පත්‍රයේ* සඳහන් ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම දක්වා ගොස් එතැන් සිට වාන්ගාමම් ප්‍රධාන වාරි ඇළෙහි මධ්‍ය රේඛාව ඔස්සේ හතරවන වාන් ගාමම් ඇළ දක්වා ගොස් එතැන් සිට නැගෙනහිර දෙසට එම හතරවන වාන්ගාමම් ඇළෙහි මධ්‍ය රේඛාව ඔස්සේ 3.5 වන ඇළ හමුවී එම 3.5 වන ඇළෙහි මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දෙසට ඉලුක්කුච්චේනයි වැවේ දකුණු මායිම සහ මෙම 3.5 දරන වාන්ගාමම් ඇළ හමුවන ලක්ෂය දක්වා ගොස් එතැන් සිට උතුරු දෙසට ඉලුක්කුච්චේනයි වැවේ බටහිර මායිම දිගේ පනන්කාට්ටු අතු ඇළ සහ ඉලුක්කුච්චේනයි වැව හමුවන ලක්ෂය දක්වා ගොස් එතැන සිට උතුරු දෙසට එම පනන්කාට්ටු අතු ඇළෙහි මධ්‍ය රේඛාව දිගේ ගොස් අක්කරපත්තුව අම්පාර ප්‍රධාන පාරෙහි පිහිටි 13/2 දරන බෝක්කුව හමුවී එතැන් සිට අක්කරපත්තුව අම්පාර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට අම්පාර අක්කරපත්තුව මාර්ගයේ පිහිටි උස් බිම තෙක් ගොස් එතැන් සිට එම උස් බිමෙහි දකුණු මායිම දිගේ නැගෙනහිර දෙසට පනන්කාට්ටු ප්‍රධාන වාරි ඇළ දක්වා ගොස් එම ලක්ෂයේ සිට පනන්කාට්ටු ප්‍රධාන වාරි ඇළේ මධ්‍ය රේඛාව දිගේ උතුරු දෙසට ගොස් එම පනන්කාට්ටු ප්‍රධාන වාරි ඇළ සහ දකුණු ඉවුර ප්‍රධාන වාරි ඇළ හමුවන ලක්ෂය දක්වා ද වේ.

01 - 414/1

**මහ නගර සභා ආඥාපනත**

නියමය

මහ නගර සභා ආඥා පනතේ (252 වැනි අධිකාරය) 2, 3, 5 සහ 9 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ඒ. එල් එම්. අතාඋල්ලා, වන මම, මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යය සඳහා මහා නගරයක් විය යුතු යයි ප්‍රකාශ කරමි ;

(2) එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම මහා නගරයේ පරිපාලන සීමා ලෙස නිශ්චය කරමි ;

(3) මෙම නියමයේ (I) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහා නගරය සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කර, එම මහා නගර සභාවට පහත සඳහන් නාමය සහ නිල නාමය පවරමි :-

**"අක්කරයිපත්තු මහ නගර සභාව"**

(4) අක්කරයිපත්තු මහා නගර සභාව නගරාධිපතිවරයකු, උප නගරාධිපතිවරයකු සහ තෝරා පත් කරගත් වෙනත් සභිකයින් හත්දෙනෙකුගෙන් සමන්විත විය යුතුයයි තීරණය කරමි ;

(5) අක්කරයිපත්තු මහා නගර සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය 2011 අප්‍රේල් මස පළමුවැනි දිනය වශයෙන් නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

***උපලේඛනය***

***I වැනි කොටස***

**අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහත සඳහන් ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය**

නගර කොට්ඨාස - 01 (AP/15A), නගර කොට්ඨාස - 02 (AP/15A/1), නගර කොට්ඨාස - 03 (AP/15A/2), නගර කොට්ඨාස - 04 (AP/15A/3), නගර කොට්ඨාස - 05 (AP/15A/4), අක්කරපත්තුව - 01 (AP/15), අක්කරපත්තුව - 02 (AP/16), අක්කරපත්තුව - 03 (AP/17), අක්කරපත්තුව - 04 (AP/18), අක්කරපත්තුව - 05 (AP/19), අක්කරපත්තුව - 06 (AP/20), අක්කරපත්තුව - 10 (AP/15A/1), අක්කරපත්තුව - 11 (AP/15A/2), අක්කරපත්තුව - 12 (AP/15A/3), අක්කරපත්තුව - 13 (AP/15A/4), අක්කරපත්තුව - 14 (AP/15A/5), අක්කරපත්තුව - 15 (AP/16A), අක්කරපත්තුව - 16 (AP/17A), අක්කරපත්තුව - 17 (AP/18A), අක්කරපත්තුව - 18 (AP/19A), අක්කරපත්තුව - 19 (AP/18/19/20), අක්කරපත්තුව - 20 (AP/20/1), අක්කරපත්තුව - 21 (AP/20/2),

***II වැනි කොටස***

අක්කරපත්තු මහනගර සභාවේ පරිපාලන සීමා මායිම්

උතුරට :

පට්ටියඩිප්පිට්ටි පාලමේ මධ්‍ය ලක්ෂයේ සිට තිල්ලෙයි ගඟ දිගේ ඍජු ලෙස උතුරු දෙසට ගමන් කරන රේඛාව අඩ්ඩලච්චේන ප්‍රාදේශීය සභාවේ දැනට පවතින දකුණු මායිම හමුවන ලක්ෂයේ සිට නැගෙනහිර දෙසට එම මායිම් දිගේ ද බාවා පාරට පැමිණ එම පාර දිගේ අක්කරපත්තුව - කල්මුනේ මහා මාර්ගය තෙක් ගමන් කොට එතැන් සිට වඩ්ච්චල් පාරේ මධ්‍ය රේඛාව දිගේ කෝණාවත්ත ඔය හරහා මුහුදු වෙරළ දක්වා ද,

*නැගෙනහිරට* :

අවසන් වරට සඳහන් කළ ලක්ෂයේ සිට දකුණු දෙසට මුහුදු වෙරළ දිගේ අක්කරපත්තුව - පොතුවිල් මාර්ගයේ පිහිටි පොදු සුසාන භූමියේ උතුරු මායිම දක්වා ද,

*දකුණට* :

අවසන් වරට සඳහන් කළ ලක්ෂයේ සිට බටහිර දෙසට ඉහත සුසාන භූමියේ උතුරු මායිම දිගේ (නගර කොට්ඨාස 05, ග්‍රාමසේවා වසමේ දකුණු මායිම) අක්කරපත්තුව පොතුවිල් මාර්ගයේ මධ්‍ය ලක්ෂය තෙක් ගොස්, එතැන් සිට උතුරු, බටහිර දෙසට (නගර කොට්ඨාස 04 ග්‍රාම සේවා වසමේ දකුණු මායිම) අක්කරපත්තුව - පොතුවිල් මාර්ගයේ මධ්‍යම රේඛාව දිගේ පරණ පොදු වෙළඳපොළෙහි (දැනට බස් නැවතුම් පොළ පරිශ්‍රය) ඊසාන මායිම තෙක් ගොස් එතැන් සිට දකුණු දෙසට පරණ පොදු වෙළඳපොළ නැගෙනහිරින් පිහිටි මාර්ගයේ මධ්‍ය රේඛාව දිගේ පරණ පොදු වෙළඳපොළේ ගිණිකොන මායිම දක්වා ගොස් එතැන් සිට බටහිර දෙසට පරණ පොදු වෙළඳපොළේ දකුණු මායිම දිගේ (නගර කොට්ඨාස 01 ග්‍රාම සේවා වසමේ දකුණු මායිම) අක්කරපත්තුව - සාගම පාරේ මධ්‍ය ලක්ෂය දක්වා ගොස් එතැන් සිට අක්කරපත්තුව - සාගම පාරේ මධ්‍ය රේඛාව දිගේ උතුරු දෙසට අක්කරපත්තුව - කල්මුණේ ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව දිගේ ස්මායිල් ස්ටෝර්ස් පාර හන්දියට පැමිණ එතැන් සිට බටහිර දෙසට ස්මායිල් ස්ටෝර්ස් පාරේ මධ්‍ය රේඛාව දිගේ (අක්කරපත්තුව - 02 ග්‍රාම සේවා වසමේ දකුණු මායිම) තෝම්බුතෝර් පාර හමුවී, එතැන් සිට බටහිර දෙසට තෝම්බුතෝර් පාරේ මධ්‍ය රේඛාව දිගේ (අක්කරපත්තුව - 03 ග්‍රාම සේවා වසමේ දකුණු මායිම) මුදලියාර් පාර දක්වා ගොස් එතැන් සිට දකුණු දෙසට මුදලියාර් පාරේ මධ්‍ය රේඛාව දිගේ (අක්කරපත්තුව - 19 ග්‍රාම සේවා වසමේ නැගෙනහිර මායිම) අක්කරපත්තුව - අම්පාර මාර්ගය හමුවී, එතැන් සිට බටහිර දෙසට අක්කරපත්තුව - අම්පාර මාර්ගයේ මධ්‍ය රේඛාව දිගේ (අක්කරපත්තු - 19 ග්‍රාම සේවා වසමේ දකුණු මායිම) අක්කරපත්තුව දිස්ත්‍රික් රෝහලේ ගිණිකොන මායිම දක්වා ගොස් එතැන් සිට එම රෝහලේ නැගෙනහිර, උතුර මායිම් දිගේ එම රෝහලේ බටහිරින් පිහිටි පාරේ මධ්‍ය ලක්ෂය දක්වා ගොස් එතැන් සිට දකුණු දෙසට එම පාරේ මධ්‍ය රේඛාව දිගේ අක්කරපත්තුව - අම්පාර මාර්ගයේ මධ්‍ය ලක්ෂය දක්වා ගොස් එම ලක්ෂයේ සිට බටහිර දෙසට අක්කරපත්තුව - 19 ග්‍රාම සේවා වසමේ දකුණ, බටහිර මායිම් දිගේ ද, අක්කරපත්තුව - 21 ග්‍රාම සේවා වසමේ දකුණු මායිම දිගේ ද, අක්කරපත්තුව - අම්පාර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ පට්ටියඩිප්පිට්ටි පාලමේ මධ්‍ය ලක්ෂය දක්වා ද,

*බස්නාහිරට* :

අවසන් වරට සඳහන් කළ ලක්ෂයේ සිට සෘජු ලෙස උතුරු දෙසට තිල්ලෙයි ගඟ දිගේ අඩ්ඩලච්චේන ප්‍රාදේශීය සභාවේ දැනට පවතින දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා ද වේ.

01 - 414/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.